# ජාතක කතා පොත ආශ්‍රයෙන් බෞද්ධ ළමා සාහිත්‍ය කෘති සම්පාදනයේදි ඡේක ව්‍යවහාරය සරලව සංස්කරණයට වාග් විද්‍යාවෙහි දායකත්වය

එන්. ඊ. එච්. ලංකා[1]

## හැඳින්වීම

සිංහලයේ සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යය විමර්ශනයේදි පන්සිය පනස් ජාතක කතා පොතෙන් විනිර්මුක්තව එකී කාර්යයෙහි සාඵල්‍යතාවක් නොපවතී. උසස් විශ්වීය සාහිත්‍ය කෘති සමඟ සමකක්ෂය භජනය කිරීමට තරමින් ශක්‍යතාවක් පවතින , ජාතක කතා පොතෙහි කතා වස්තුවලින් පළට වනුයේ විශ්ව සත්‍ය හා මනුෂ්‍ය ජීවිතය සම්බන්ධව පූර්ණ අර්ථකථනයකි. ඇතැම්හු මේ වනාහි බුද්ධ භාෂිත ලෙසම සලකති. ජාතක කතා සිංහලයට පරිවර්තනය කිරීමෙන් විරචිත ග්‍රන්ථය ලෙස වත්මන් ජාතක කතා පොත හඳුන්වා දිය හැක කෙසේ වතුඳු ජාතක කතා පොත සම්පාදනය කුරුණෑගල යුගය තුළ සිදුවූ බව දැක්වුවත් කර්තෘත්වය සම්බන්ධව ගද්‍ය ඉතිහාසය තුළින් නිර්වද්‍ය සාක්ෂි හමු නොවේ. එහිදී මහාවංශයේ අන්තර්ගත කරුණු සම්බන්ධව විචාරාක්ෂිය යොමු වේ. කෘතියෙහි ප්‍රමාණය මෙන්ම එහි රචනා ශෛලියෙහි පවතින විසමතා කෘතිය රචනයෙහි ගෞරවය එක් කතෘවරයකුට පමණක් සීමා නොකරයි. එහෙයින් ජාතක කතා පොත ධීමත් කර්තෘ මණ්ඩලයක දීර්ඝ කාලීන පරිශ්‍රමයක් බැව් පිළිගැනීමට ඖචිත්‍ය සාක්ෂ්‍ය කෘතිය තුළම ගැබ්ව ඇත.ජාතක කතා පොතෙහි එන කතා වස්තුවල සන්දර්භය ද සුවිශේෂ වේ. සෑම ජාතක කතාවක්ම ප්‍රාරම්භ, අතීත හා අවසාන වශයෙන් ත්‍රිත්වාකාරයෙන් දැක්වේ. ජාතක කතාවල පවතින තවත් සුවිශේෂත්වයක් නම් ළමා කතාවලට සාම්‍ය වන්නාවූ සිඟිති කතා සමූහයක් එහි අන්තර්ගත වීමයි. මෙමඟින් ළමා මනසට ගෝචර වන්නාවූ සරල ආනුභූතීන් ඔස්සේ උසස් හර පද්ධතියක් ළමා ලොවට දායාද කර දේ. එහෙත් සම්භාව්‍ය ගද්‍ය කෘතියක් වනාහි හුදෙක් ඡේක ව්‍යවහාරය ගුරු කොට ගත්තකි. බහුශ්‍රැත කර්තෘ මණ්ඩලයක ලේඛන ව්‍යාපාරයේ ඉෂ්ට ඵලයක් වන ජාතක කතා පොතෙහි භාෂාව, උපමා,පිරුළු,ප්‍රාදේශීය උපභාෂා ප්‍රයෝග හා සකු පාලි හා ද්‍රවිඩ මිශ්‍රිත භාෂා ව්‍යවහාරයක ප්‍රතිබිම්භයකි. එහෙයින් කතා වස්තුව කොතෙක් සරල වුවත්, විදග්ධ බස් වහර ළමා මනසට ගෝචර නොවේ. මේ හේතුවෙන් ළමා සාහිත්‍ය කෘතියක් ලෙස ජාතක කතා පුනර්රචනයේ දී එහි භාෂාව ක්‍රමිකව සංස්කරණය කළ යුතුය. ඇතැම් ළමා ලේඛකයෝ ජාතක කතාවල සාරය ගෙන විකල්ප ක්‍රමවේද ඔස්සේ ළමා කෘති රචනයේ යෙදෙති. ඔවුහු මූලාශ්‍රය කෘතියෙහි වැදගත්කම හා බෞද්ධාගමෙහි සාරය අත්හැර දමති. ජාතක කතාවේ සන්දර්භය ද

1 සහය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
hasini.lanka@gmail.com

අත්හරිති. එහෙත් ප්‍රාරම්භ, අතීත හා අවසාන යන ත්‍රිත්වාකාර සන්දර්භ ළමා මනසෙහි සංසාරික බුද්ධි වර්ධනයට අත්‍යවශ්‍යය.ජාතක කතාවෙහි එන භාෂාව සරල කිරීම යනු හුදෙක් ජාතක කතාව විකෘති කිරීමක් නොවිය යුතුය. මේ උදෙසා වාග් විද්‍යාත්මක සිද්ධාන්ත මහෝපකාරී වේ. මෙම අධ්‍යයනයේ අභීෂ්ටාර්ථය වනුයේ උක්තාකාරයෙන් ඡේක ව්‍යවහාරය සරල ව්‍යවහාරයක් බවට සංස්කරණයේ දී වාග් විද්‍යාත්මක සිද්ධාන්ත උපයුක්තව එකී කාර්යය සිදුකරන ආකාරය විශද කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

පන්සිය පනස් ජාතක කතා පොත ආශ්‍රිතව ළමා සාහිත්‍ය කෘති සම්පාදනයෙ ඡේක ව්‍යවහාරය සරලව සංස්කරණයට වාග් විද්‍යාව දායක කරගනුයේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මුද්‍රිත ජාතක කතා පොතෙහි ඇති පන්සිය තිස් අටක් වන ජාතක කතා සමුච්චය අතරින් ළමා මනසට ඖචිත්‍යවත් ජාතක කතා දහයක් පර්යේෂණ සීමාව ලෙස උපයුක්තය. ඒ වූ කලී වානරින්ද, බක, සුව, කාකෝලූක, දද්දභ, කච්ඡප, සේරිවාණිජ, වණ්ණුපථ, නළපාන හා ස්වර්ණ හංස යන කතා වස්තුය. අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යය හා වාග්විද්‍යාව භාවිත වේ.බෞද්ධ සාහිත්‍යය ආශ්‍රයෙන් උසස් ළමා සාහිත්‍යයක් ගොඩ නැංවීම, ළමා සාහිත්‍යකරුවන්ට මාර්ගෝපදේශකත්වයක් සැපයීම, ලිඛිත සිංහලයේ ප්‍රවර්ධනයට වාග් විද්‍යාවේ උපයෝගිතාව ගම්‍ය කිරීම හා ධර්ම කරුණු සන්නිවේදනයෙහි ලා භාෂාව භාවිතයේදී අනුගමනය කළ හැකි නව්‍ය භාෂාත්මක උපක්‍රම සම්පාදනය පර්යේෂණ ආරම්මණ වේ.

දත්ත ඒකරාශි කිරීමේදී සම්මුඛ සාකච්ඡා, ප්‍රායෝගික පර්යේෂණ හා පුස්තකාල පරිහරණය යන පර්යේෂණ ක්‍රම විධි භාවිතයට ගැනුණි. ළමා ලේඛකයන් විෂය කරගනිමින් සිදුකරනු ලබන සම්මුඛ සාකච්ඡා ඔස්සේ ළමා භාෂාව හා දැනට පවතින ශිල්පීය උපක්‍රම සම්බන්ධව දත්ත ලබා ගැනුණි.එමෙන්ම දැනට මුද්‍රිතව පවතින ජාතක කතා ආශ්‍රිත ළමා කෘතිවල පවතින දුර්වලතා හඳුනාගැනීමක් ද වක්‍රව සිදුවුණි. ඡේක ව්‍යවහාරය සහිත කතා වස්තුවක් පඨනයට වයස අවුරුදු හය සහ එකොළහ අතර දරුවන් දස දෙනෙකු යොමු කරවීමෙන් මතු ඔවුන් ග්‍රහණය කර ගන්නා දේ හා අවබෝධයෙන් දූරස්ථ වන අංශ ප්‍රායෝගික පර්යේෂණයක් මඟින් සටහන් කරගත් අතර අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ කෘති පරිහරණය ද දත්ත රැස්කිරීමේ විධික්‍රමයක් ලෙස යොදා ගන්නා ලදි.

දත්ත විශ්ලේෂණයේ දි මනෝවිෂයික වාග්විද්‍යාවේ හා සංස්ථිතික වාග් විද්‍යාවේ විධික්‍රම භාවිත කෙරුණි. ළමා වාග්කෝෂයට අනුකූල වන අයුරින් පදිම උත්පාදනය සිදු කළ අතර දීර්ඝ වාක්‍ය සරල වාක්‍ය බවට පරිවර්තනයේ දි අර්ථ විචාරාත්මක අංශ කෙරේ අවධානය යොමුවුණි.

ප්‍රතියෝජක ජනක ව්‍යාකරණය , භාෂා උපාර්ජනය හා විග්‍රහාත්මක වාග්විද්‍යාවේ න්‍යායන් ගුරු කොට ගැනීමෙන් උක්ත පර්යේෂණ ගැටලුවට විසඳුම් ගවේෂණය කෙරුණි.

## ප්‍රතිඵල

ප්‍රායෝගික පරීක්ෂණය මඟින් අනාවරණය කරගත් දත්ත අනුව ළමයින් දසදෙනා අතුරින් පස්දෙනෙකු ජාතක කතා තුළ පැවති වචන සුබෝච්චාරණයෙහි අසමත් විය.එහෙයින් පවතින වචන වෙනුවට නව වචන නිර්මාණයට අවශ්‍ය බැව් ගම්‍යමාන විය.දීර්ඝ වාක්‍යවල අර්ථය අවබෝධයට ළමයින් සතර දෙනෙක් සමත් වූහ. එහෙත් අර්ථාවබෝධයේ අඩුලුහුඩුතා පැවතුණි. තමුන් විසින් කියවන ලද කතා වස්තුව, අවබෝධ කරගත් ආකාරයට සරලව ප්‍රකාශකිරීමට ළමයින් දෙදෙනෙකුට හැකි වූ අතර ඔවුන්ගේ භාෂා ශක්‍යතාව ඉහළ මට්ටමක පැවතුණි. වාග්විද්‍යාත්මක සිද්ධාන්ත අනුගමනය කරමින් සකස් කරගත් දළ පිටපත් දහය ළමුන්ට කියවීමට දුන් කල්හි අට දෙනෙකු විසින් නිවැරදිව අර්ථය අවබෝධ කර ගන්නා ලදි.අසමත් වූ ළමයින් දෙදෙනා සතුව ඌන භාෂා ශක්‍යතාවක් පවතින බැව් වැඩිදුර පර්යේෂණයේ දී සනාථ විය. සරල වාක්‍ය රටා, වාක්‍ය විචාරාත්මකව සැකසූ නව වැකි, සංකීර්ණ වචන විස්තරාත්මකව දැක්වීම් හා උත්පාදිත නව පදිම සකසන ලද පිටපත්වල අන්තර්ගත වේ. 'එසමයෙහි' වැනි පද වෙනුවට 'ඒ කාලයේ ' වැනි පද භාවිතයද, ආමන්ත්‍රණාර්ථයෙන් යෙදෙන 'මත්ස්‍යයෙනි' වැනි පද සඳහා 'මාළුවෝ' වැනි සරලාර්ථ පරිසේවනයද 'වංචා ප්‍රයෝග' වැනි වචන 'කපටිකම්' වශයෙන් සංස්කරණයද නිදර්ශන ලෙස දක්වනු වටී.

## නිගමනය

වෙනත් වැඩිහිටි ළමා සාහිත්‍යකරුවන් විසින් රචනය කරන ලද ජාතක කතා හා වාග්විද්‍යාත්මක සිද්ධාන්තවලට අනුව සංස්කරණය කරන ලද ජාතක කතා අතර විසමතා පැවතුණි. එමෙන්ම වෙනත් සංස්කරණවල මෙන් කතා ශරීරයට හානිවීමක් නොතිබුණි.නිර්මාණාත්මක භාෂා උපක්‍රම ඔස්සේ වර්තමාන කතාව ,අතීත කතාව හා පූර්වාපර සන්ධි ගැළපීම් මූල කෘතියෙහි පරිදි බන්ධනය වී පැවතුණි. සම්මත වචනවලට ලිහිල් බසින් පැහැදිලි කිරීමක් ලබාදීමෙන් කියවීම වෙහෙසකර නොවිණි.වාග් විද්‍යානුකූලව ශබ්ද හා ශබ්දිම ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කළ හෙයින් කෘතියෙහි ශබ්ද රසය ද අන්තර්ගත වේ.ඒ වනාහි ළමා මනස දහම් කරුණු කෙරෙහි ආශක්ත වීමට හේතු ප්‍රත්‍ය වන්නකි. පර්යේෂණයට අනුකූලව ගම්‍ය කරගනු ලැබූ සාධක ඔස්සේ ජාතක කතා ඇසුරෙන් ළමා සාහිත්‍ය කෘති සම්පාදනයට වාග්විද්‍යාත්මක සිද්ධාන්ත පරිසේවනයේදී සාධනීය ගුණාංග පළට වේ. ලංකා බුද්ධ ශාසනය නංවාලීමේ ක්‍රියා මාර්ගයක්

ලෙස, ලිඛිත මාධ්‍යයෙන් ධර්මය සන්නිවේදනයට හා ධර්මය සංරක්‍ෂණයට වාග්විද්‍යාව යන විෂය ක්‍ෂේත්‍රය උක්තාකාරයෙන් දයකකර ගත හැක.

**ප්‍රමුඛ පදඃ** සංසාරික බුද්ධිය, සාමූහික ඥණය හා අන්තර්ඥාණය, භාෂා උපාර්ජනය, නව වචන නිර්මාණය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*පන්සිය පනස් ජාතක පොත* (සංස්.). පූජ්‍ය වත්තේවැවේ චන්දිම ස්ථවිර. (2009). කොළඹඃ ඇම්.ඩී ගුණසේන සමාගම.

කුලසූරිය ,ආනන්ද. (1997). *සිංහල සාහිත්‍යය 4,* බොරලැස්ලමුවඃවිසිදුනු ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ ,මාර්ටින්. (1958). *ජාතක කතා විමසුම.* කොළඹඃ ඇම්.ඩී. ගුණසේන සමාගම.

වික්‍රමසිංහ ,මාර්ටින්. (1958). බණ කතා සාහිත්‍යය. මහරගමඃ සමන් මුද්‍රණාලය.